ස්ත්‍රී පුරුෂ භාවය පදනම් කරගනිමින් සිදුවන කොන් කිරීම් මාධ්‍ය තුළ විවිධාකාරයෙන් දක්නට ලැබේ. ඉන් එක් ආකාරයක් වන්නේ, ස්ත්‍රී සහ පුරුෂ දෙපාර්ශවයටම අයත් පුද්ගලයින් සම්බන්ධ වන සෘණාත්මක සන්දර්භයකදී ස්ත්‍රිය පමණක් ඉස්මතු කොට දැක්වීමයි. ඊට උදාහරණ ලෙසින් පහත පුවත් වාර්තාවන්හි දැක්වෙන "කතක් ඇතුළු දෙදෙනෙක් යාපනයේදී අත්අඩංගුවට", "කතක් ඇතුළු 3ක් අත්අඩංගුවට", "කත සමග තිදෙනෙක් අත්අඩංගුවට" වැනි උප සිරස්තල දැක්විය හැක.

මෙවැනි සෘණාත්මක සන්දර්භයන් තුළදී, මෙම දැක්වෙන කාන්තාවන්ගේ විශේෂිත භූමිකාවක් නොමැති නම්, පුරුෂ පාර්ශවය ඉස්මතු නොවී කාන්තාව පමණක් ඉස්මතු කරන්නේ මන්ද? එය ස්ත්‍රී පුරුෂ භාවය මත ඇයව කොන් කිරීමක් නොවේද? එසේ නම් එය ආචාර ධර්ම විරෝධී නොවන්නේද?

#MediaEthicsSL #lka #SinhalaPress #Lankadeepa #Divaina